**ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතර දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6.1(ඇ) උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7(ii) ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් රැස්කළ ආදායම්, වෙනත් ලැබීම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්විය යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී එසේ රැස්කළ රු.181,134,730 ක ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස දක්වා නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම.. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය සකසා ඇත. |
| (ආ) | ඉහත (අ) ඡේදයේ සඳහන් නිරීක්ෂණය හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අග්‍රිම ශේෂය රු.3,154,850,991 ක් විය යුතුව තිබුණත්, එය රු.181,134,730 ක් අඩුවෙන් රු.2,973,716,261 ක් ලෙස දක්වා තිබුණි. | - ඉහත පරිදි - | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර ඇත. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මාලිම්බඩ හා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් සතු ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන තක්සේරු කර තිබුණු වටිනාකම හා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර තිබුණු වටිනාකම අතර රු.3,883,290 ක වෙනසක් අනාවරණය විය. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | අත්හැරීමකින් ගිණුම්ගත කිරීමට නොහැකි වී ඇති වටිනාකම් ගිණුම්ගත කිරීමට උපදෙස් දෙන ලදි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක වත්කම් | -ඉහත පරිදි - | මෙම වෙනස්කම් බොහොමයක් Cigas පරිගණක වැඩසටහනේ |

| | | | |
|---|---|---|---|
| | ශේෂ දැක්වීමේදී ඉකුත් වර්ෂයේ සිට පැවත එන වෙනස්කම් ද ඇතුළත්ව අගය අඩුවීම් ලෙස එකතුව රු.296,297,567 ක හා අගය වැඩිවීම් ලෙස රු.1,489,194 ක වෙනස්වීම් හඳුනාගෙන නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | | ස්ථාවර වත්කම් මොඩියුලයට ඇතුළත් කිරීමට නොහැකි වීමෙන් ඇතිවූ වෙනස්කම් බව සඳහන් කරමි. එම වෙනස්කම් දැනට හඳුනාගෙන ඇති බැවින් 2019 වර්ෂයේදී නිවැරදි කරන ලෙස උපදෙස් දී ඇත. |
| (ඈ) | වෙනත් ආයතන විසින් ලබාදුන් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 කට ලබා දුන් වත්කම් පිළිබඳ විස්තර හා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ තොරතුරු අතර රු.83,177,743 ක වෙනසක් අනාවරණය විය. එසේම 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කරන ලද වෙනත් ආයතනවලින් අත්පත් කරගත් වත්කම්වල අයිතිය විධිමත්ව පවරා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | වෙනත් ආයතනවලින් ලැබෙන වත්කම්වල අයිතිය විධිමත් පරිදි පවරා ගැනීම හා නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කළයුතු වීම. | වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් ලබාදෙනු ලබන ප්‍රතිපාදන මගින් අත්පත් කරගත් වත්කම් යම් නීත්‍යානුකූල ආකාරයකට පවරා දෙන ලෙස එම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලින් ඉල්ලා සිටින ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අයත් ඉඩම් හඳුනාගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ඉඩම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් ලබාදී ඇත. |
| (ඉ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක ගොඩනැගිලි ඉදිකිරීම්වලට අදාළව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවල වැඩ කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් වශයෙන් එකතුව රු.51,165,380 ක් ගෙවා තිබුණි. එයින් ඉටුකළ වැඩ අනුව එකතුව රු.14,873,600 ක් ආපසු අයකරගෙන තිබුණු නමුත් 2018 දෙසැම්බර් 31 දින රු.36,291,780 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණි. නිරවුල් නොකළ අත්තිකාරම් ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | 2016 අගෝස්තු 03 දිනැති අංක 250/2016 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මෙම වටිනාකම් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාවේ නොනිම් වැඩ ලෙස ඇතුළත් කර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇත. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | පවත්නා ගොඩනැගිලිවල සවිකර ඇති විදුලි උපකරණ හඳුනා ගැනීම සිදුකරමින් පවතින අතර, ඒ අනුව ඉදිරියේදී ලේඛනය සකස් කරමි. |
| (ආ) | **උප පත්‍රිකා පොත් ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව උප පත්‍රිකා ලේඛනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 341 ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | දැනට පවත්වාගෙන යන ලේඛනයේ අඩුපාඩු සම්පූර්ණ කර පවත්වාගෙන යන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. |
| (ඇ) | **වාහන ලොග් පොත** | | |
| | මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාරව වාහන ලොග් පොත් තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 1645(අ) ප්‍රකාරව කටයුතු කළ යුතුවීම | වාහන ලොග් පොත් නොපවත්වන්නේද යන බව සොයා බලා වාර්තා කරන ලෙස ප්‍රාදේශීය ලේකම්ට උපදෙස් ලබාදී ඇත. |

(ඇ) **ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය**

| | | |
|---|---|---|
| ප්‍රසම්පාදන කමිටුවල හා තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංශ කිහිපයක් විසින් ප්‍රසම්පාදන කටයුතු සිදු කරන බැවින් ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවලට අදාළ සාමාජිකයන් අත්සන් කරනු ලබයි. ඉදිරියේදී වෙන වෙනම පැමිණීමේ ලේඛන පවත්වාගෙන යන ලෙස උපදෙස් දී ඇත. |

(ඉ) **ලංසු කැඳවීමේ ලේඛනය**

| | | |
|---|---|---|
| මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලංසු කැඳවීමේ ලේඛනය පවත්වා නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මාර්ගෝපදේශ 5.2.1 අනුව ලංසු කැඳවීමේ ලේඛනයක් පවත්වාගෙන යන ලෙස ප්‍රාදේශීය ලේකම්ට උපදෙස් දී ඇත. |

## 1.6.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | අදහස් දක්වා නොතිබුණි. |

සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 540(2) | දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප්ගේ උපකාරක රෙජිස්ටර් දෛනිකව හරි වැරදි බලන නිලධාරියා විසින් විධිමත් පරිදි පරීක්ෂා කර තිබුණු බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 540(2) ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සරප් රාජකාරි සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂණවලදී වැඩි අවධානය යොමු කරන ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත දැනුම් දී ඇත. |
| (ii) මුදල්රෙගුලාසි 571 | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ එකතුව රු.166,064,584 ක් වූ 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලයට අයත් වර්ෂ 02 ක් ඉක්මවූ පොදු තැන්පත් ශේෂ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ප්‍රමාණවත් අග්‍රිම නොලැබීමත් සමහර රැඳවුම් මුදල් නිදහස් කිරීම සඳහා අවශ්‍ය වන ලියකියවිලිවල පැවති අඩුපාඩු හේතුවෙන් මෙම මුදල් නිදහස් කිරීමට නොහැකි විය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ<br>-------------------------<br>2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය | 2018 වර්ෂයේ සිට එක් එක් ආයතනය විසින් මිලදී ගන්නා ලද සහ අපහරණය කරන ලද වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාළ කාර්තුව අවසානයේදී කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළයුතු වුවද ඒ අනුව එම තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අදාළ ආකෘතිය පරිදි වාර්තා යාවත්කාලීනව පවත්වන ලෙස උපදෙස් දුනිමි. |

**1.6.6 අවිධිමත් ගනුදෙනු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ----------- | ------------------------- |
| | 2017 මැයි මාසයේ සිදුවූ ගංවතුර ආපදාව හේතුවෙන් මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවාස හානි වූවන්ට වන්දි ගෙවීම සඳහා රු.148,252,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2018 සැප්තැම්බර් 08 දින වන විට හානි වූ නිවාස 1,328 ක් සඳහා එකතුව රු.96,969,317 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධව සිදුකළ ස්ථානීය පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය. | | |
| (අ) | ගංවතුර හානිවී තිබුණත් කිසිදු අළුත්වැඩියාවක් සිදු නොකර භාවිතා කරමින් තිබුණු නිවාස 02 ක් සඳහා එකතුව රු.957,313 ක් පූර්ණ හානි ලෙස වන්දි ගෙවා තිබුණි. | නිවාස කමිටුව විසින් ගෙවීම් නිර්දේශ කිරීමේදී ඒ සඳහා ලබාදී ඇති උපදෙස් අනුව කටයුතු කළ යුතුවීම. | මෙම විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකොට වාර්තා කිරීමට කටයුතු කරමි. |
| (ආ) | නැවත අවදානමක් ඇති ස්ථානයක වූ නිවසකට එම ස්ථානයේම නිවස ඉදිකිරීම | නිවාස කමිටුව විසින් ගෙවීම් නිර්දේශ කිරීමේදී ඒ සඳහා ලබාදී ඇති | අයදුම්කරු මුල් පදිංචි ස්ථානය වෙනස් කිරීමට අකමැති බැවින් අනුමත වන්දි |

| | | | |
|---|---|---|---|
| | සඳහා රු.1,200,000 ක වන්දි ගෙවා තිබුණි. | උපදෙස් පිළිබඳව අවධානයට ගෙන කටයුතු කළ යුතු අතර අවශ්‍ය තහවුරු කිරීම් නිවැරදිව ලබාගත යුතුවීම. | මුදල නැවත තක්සේරු කර ගෙවීම් කළෙමි. |
| (ඇ) | ගොඩනැගිලිවල හිමිකාරිත්වය තහවුරු කර නොතිබුණු ව්‍යාපාරික ස්ථානයක් හා නිවසක් සඳහා රු.1,056,225 ක් වන්දි ගෙවා තිබුණි. | නිවාස කමිටුව විසින් ගෙවීම් නිර්දේශ කිරීමේදී ඒ සඳහා ලබාදී ඇති උපදෙස් පිළිබඳව අවධානයට ගෙන කටයුතු කළ යුතු අතර අවශ්‍ය තහවුරු කිරීම් නිවැරදිව ලබාගත යුතුවීම. | ග්‍රාම නිලධාරිගේ තොරතුරු පරස්පර වූ අතර නිවාස කමිටුවේ තහවුරු කිරීම් අනුව කටයුතු කළෙමි. ව්‍යාපාර ලියාපදිංචිය අවශ්‍ය නොවන අතර ජාතික රක්ෂණභාර අරමුදල මගින් නිකුත්කර ඇති මාර්ගෝපදේශය සහ 2016 ජූලි 18 දිනැති මාගේ ලිපිය අනුව කටයුතු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

## 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| වැය විෂයයන් 08 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදනවලින් උපයෝජනයන් කළ පසු ඉතිරිය සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ක සිට සියයට 86 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | **මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතුවීම** | වියදම් පාලනය කළ නොහැකි අත්‍යවශ්‍ය වියදම් දැරීමට සිදුවූ අතිරේක ප්‍රතිපාදනයන් අවශ්‍ය වූ වැය විෂයයන් සඳහා අයවැය දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතිය සහිතව ප්‍රතිපාදන වැඩිකර ගන්නා ලදි. |

**2.2** තැන්පත් ගිණුම්

-----------------

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවැත එන එකතුව රු.172,127,578 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ප්‍රමාණවත් අග්‍රිම නොලැබීමත්, සමහර රඳවුම් මුදල් නිදහස් කිරීම සඳහා අවශ්‍ය වන ලියකියවිලිවල පැවති අඩුපාඩුත් නිසා මෙම තැන්පතු නිදහස් කිරීමට නොහැකි වී ඇත. |

**2.3** බැරකම් හා බැදීම්වලට එළඹීම

----------------------------------

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණනය වෙත ඉදිරිපත් වූ මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට බැරකම් රු.1,695,199 ක් ලෙස දක්වා තිබුණද, ඒ සම්බන්ධයෙන් වූ Cigas ගිණුම්කරණ වාර්තාව අනුව එය රු.56,502,100 ක් ලෙස දක්වා තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | අදාළ Cigas ගිණුම්කරණ වාර්තාව විගණනයට ඉදිරිපත් කර ඇත. |

**2.4** **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය වෙනුවෙන් විමධ්‍යගත වැඩසටහන් 11 ක් සඳහා රු.8,505,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විට රු.7,911,281 ක වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. ප්‍රතිපාදන රු.596,800 ක් සලසා තිබුණු එක් වැඩසටහනක් පමණක් අවිච්ඡේද වී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී | | |

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | | | |
|---|---|---|---|
| (අ) | අවස්ථා 04 කදී එකතුව රු.4,202,100 ක් වූ මිලදී ගැනීම් සිදුකර තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) මාර්ගෝපදේශයට ප්‍රකාරව එම සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම | ඉදිරියේදී එය නිවැරදි කර ගැනීමට කටයුතු කරන ලෙස ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබාදී ඇත. |
| (ආ) | 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් රු.1,867,250 ක් හා රු.1,340,000 ක් වශයෙන් එකතුව රු.3,207,250 ක් වටිනා බෞද්ධ පොත්පත් හා උපකරණ ප්‍රදේශයේ පදනමක් වෙත ලබා දී තිබුණි. පොත්පත් හා උපකරණ බෙදාදීම සඳහා වන අවශ්‍යතාවයන් දැක්වෙන ලිපි, බෙදුම් ලේඛන, බෙදාදුන් දිනය, ලබාගත් ආයතන යනාදී විස්තර 2019 මැයි 07 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ ලිපි ලේඛන ලබා ගැනීමට කටයුතු කිරීම හා මෙම ප්‍රතිපාදන විධිමත් පරිදි උපයෝජනය වූ බව සනාථ කර ගැනීමට කටයුතු කළ යුතුවීම. | බෙදුම් ලේඛන ලබාදෙන ලෙස සමාධි පදනම වෙත නොයෙක් වර වාචිකව හා ලිඛිතව ඉල්ලීම් කළ ද මේ වන තෙක් එම අත්සන් සහිත බෙදුම් ලේඛන ලබාදී නොමැත. |
| (ඇ) | මාතර දිස්ත්‍රික්කයේ භාෂා හා තොරතුරු තාක්ෂණික දැනුම ලබාදීමට අවශ්‍ය පාඨමාලාවන් සඳහා 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් රු.4,558,712 ක් හා රු.1,241,811 ක් වශයෙන් එකතුව රු.5,800,523 ක් වටිනා පරිගණක හා උපාංග මිලදීගෙන ප්‍රදේශයේ පදනමකට ලබාදී තිබුණි. එසේ පවත්වනු ලබන පාඨමාලාවන් සම්බන්ධ විස්තර පරිගණක හා උපාංගවල අවශ්‍යතාවය හඳුනා ගැනීම, පාඨමාලාවන් හදාරන සංඛ්‍යාව සම්බන්ධ තොරතුරු හා මෙම වැඩසටහනෙහි සාර්ථකත්වය පිළිබඳ පසු විපරම් සිදුකර හෝ නොතිබුණි. | ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි 137 හා 138 ප්‍රකාරව කටයුතු කිරීම හා එම වැඩසටහන්වල ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කළ යුතුවීම. | 2019 මැයි 06 දිනැති ලිපියක් මගින් සමාධි පදනම විසින් මෙම තොරතුරු ලබාදී ඇත. |
| (ඈ) | දක්ෂිණ ලංකා තෘතියික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨයට ලබාදීම සඳහා රු.1,000,000 ක් වටිනා සංගීත භාණ්ඩ කාර්යාලය මගින් ලබාදී තිබුණි. 2014 මාර්තු 20 දිනෙන් පසුව එම ආයතනය අක්‍රිය වී ඇති අතර එහි අනුමැතිය ලබාදී තිබුණු | වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හා ගෙවීම් කිරීමට පෙර සියළුම තහවුරු කිරීම් ලබා ගෙන ඒ සඳහා අවශ්‍යවන ලිඛිත තොරතුරු සනාථ කර | මෙම කරුණට අදාළ තොරතුරු සමාධි පදනම මගින් ක්‍රම සම්පාදන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | පාඨමාලා සඳහා සංගීත භාණ්ඩවල අවශ්‍යතාවයක් ද නොතිබුණි. එසේම 2018 වර්ෂයේ මෙම ආයතනයේ ක්‍රියාකාරිත්වය මෙන්ම පාඨමාලා විස්තර හා සිසුන් සංඛ්‍යාව හා උපකරණවල අවශ්‍යතාවය මෙන්ම අධ්‍යාපන පීඨයේ කාර්ය මණ්ඩලය, උපදේශකවරුන්ගේ ලේඛනය ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ගැනීම්ද සිදුකළ යුතුවීම. | |
| (ඉ) | මාතර මැද්දවත්ත වී ගබඩාව අළුත්වැඩියා කිරීම සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් වෙත 2017 අගෝස්තු 22 දින වී අලෙවි මණ්ඩලය මගින් රු.2,198,354 ක අත්තිකාරම් ලබාදී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර පුද්ගලික ආයතනයක් වෙත රු.9,841,705 කට (එකතු කළ අගය මත බදු රහිත) කොන්ත්‍රාත්තුව පිරිනමා 2017 නොවැම්බර් 22 දින රු.1,968,342 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණි. ඊට යාබදව පිහිටි විශ්වවිද්‍යාල විද්‍යායතන සිසුන්ගේ විරෝධතාවයක් නිසා 2018 ජනවාරි මාසයේ සිට අළුත්වැඩියා කටයුතු නතර කර තිබූ අතර ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකර අළුත්වැඩියා කටයුතු නතර කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ඒ සඳහා රු.1,968,342 ක් වැය කර තිබූ අතර ඉන් රු.4,951,301 ක බැඳීම්වලට එළඹ තිබුණද, මෙම ඉදිකිරීම් නවතා ඇති නිසා ඒ සඳහා වැයකළ මුදල නිෂ්ඵල වී තිබුණි. | ඇස්තමේන්තුව අනුව ඉදිකිරීම් සිදුකර ඇති බව හා ලබාදුන් අත්තිකාරම් මුදල පියවා ගැනීම මෙන්ම ඉදිකිරීම් භාවිතා කළ හැකි තත්ත්වයට පත්කර ගැනීම කෙරෙහි විශේෂ අවධානය කිරීම. | 2019 අප්‍රේල් මාසයේදී වී අලෙවි මණ්ඩලයෙන් ලද රු.3,000,572 ක මුදලින් කොන්ත්‍රාත්කරුට ගෙවියයුතු මුදල පියවීමටත් එහිදී ලබාදුන් අත්තිකාරම් මුදල අයකර ගැනීමටත් හැකිවන බව දන්වා සිටිමි. |
| (ඊ) | ප්‍රාදේශීය ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරයා විසින් අනුමත කරන ලද මිල ගණන් භාවිතා නොකර කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් අතුරා මාර්ග 06 ක් ඉදිකිරීම් වෙනුවෙන් රු.372,443 ක සහ තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික් ලේකම්වරයා නියම කර ඇති මිලගණන් පදනම් කරගෙන තත්ත්ව පරීක්ෂණ වාර්තාව අනුව ගෙවීම් කළ යුතු වීම. | අදාළ මාර්ග ප්‍රාදේශීය සභාව සතු මාර්ග බැවින් දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද කුට්ටි ගල් මිල ඇස්තමේන්තුව අනුව ගෙවීම් කර ඇත. |

මාර්ග ඉදිකිරීම වෙනුවෙන් රු.539,941 ක අධිගෙවීමක් සිදුකර තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රධාන කාර්යභාරයන් 08 ක් ඉටු කළ යුතුව තිබුණි. සැලැස්ම අනුව ඉටු කළ යුතුව තිබුණු ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යභාරයෙහි උපකාර්යයන් 03 ක් ඉටු කිරීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 48 ක සිට සියයට 86 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. තවත් උපකාර්යයන් 03 ක් ඉටුකර නොතිබුණි. එසේ ඉටු නොකළ ප්‍රධාන කාර්යයන් සඳහා එකතුව රු.මිලියන 129.55 ක ප්‍රතිපාදන සලසා තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් ඉටුකළ යුතු වීම. | කොන්ත්‍රාත්කරුවන් ගිවිසුම් ප්‍රකාරව වැඩ ඉටු නොකිරීම නිසා ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව 2018 වර්ෂය අවසාන වනවිට කාර්යයන් නිමකළ නොහැකි වීම. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව දික්වැල්ල හා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙහි අමතර ගොඩනැගිලි ඉදිකිරීම 2018 වර්ෂයේ අවසන් කළයුතු වුවද, එම ප්‍රතිඵලය අත්පත් කර ගැනීමට නොහැකිවී තිබුණි. අකුරැස්ස, වැලිපිටිය හා කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ කාර්යයන් ද ක්‍රියාකාරී සැලැස්ම අනුව සිදුකර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත ප්‍රතිඵලය අත්පත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | කොන්ත්‍රාත්කරුවන් ගිවිසුම් ප්‍රකාරව වැඩ ඉටු නොකිරීම නිසා ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව 2018 වර්ෂය අවසාන වනවිට කාර්යයන් නිමකළ නොහැකි විය. |

## 3.2 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් 17 ක් සඳහා එකතුව රු.මිලියන 1,776.82 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් රු.මිලියන 525.64 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 1,251.18 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 70 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | සළසා තිබුණු ප්‍රතිපාදන නියමිත පරිදි උපයෝජනය කළයුතු විය. | විමධ්‍යගත අයවැය වැඩසටහනේ මන්ත්‍රී ප්‍රතිපාදන වෙන් වූ පසුව ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කරනු ලබයි. එබැවින් වෙන්වූ ප්‍රතිපාදන ඉතිරියක් සිදුවේ. |
| (ආ) | වැඩසටහන් 08 ක් වෙනුවෙන් ඇතුළත් කර තිබුණු රු.මිලියන 652.84 ක ඇස්තමේන්තුගත වටිනාකම වූ කර්මාන්ත 1427 ක් ක්‍රියාත්මක නොකර අත්හැර තිබුණි. | සළසා තිබුණු ප්‍රතිපාදන නියමිත පරිදි උපයෝජනය කළයුතු වීම. | සංශෝධන ව්‍යාපෘති අනුමත නොවීම සහ කාලය ප්‍රමාණවත් නොවීම, ඔක්තෝබර් මාසයේ ඇතිවූ දේශපාලන අර්බුදය හේතුවෙන් වැඩ තාවකාලිකව නතර කරන ලෙස දැනුම්දීම, ව්‍යාපෘති අනුමැතිය හා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම වැනි හේතූන් නිසා මෙම කර්මාන්ත කළ නොහැකි විය. |
| (ඇ) | වැඩසටහන් 06 කට අදාළව ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණු කර්මාන්ත 152 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට නිමකිරීමට අපොහොසත්වී තිබුණි. ඒ අනුව රු.179,610,172 ක්වූ ඇස්තමේන්තුගත වටිනා ව්‍යාපෘති 2019 වර්ෂයට අවිච්ඡේද කර තිබුණි. එසේම ස්වදේශ කටයුතු අමාත්‍යාංශ වැඩසටහන් යටතේ 2017 වර්ෂයෙන් 2018 වර්ෂයට අවිච්ඡේද වූ රු.මිලියන 847.55 ක් වූ ව්‍යාපෘති 81 ක් ද සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන නොලැබීම මත | සලසා තිබුණු ප්‍රතිපාදන නියමිත පරිදි උපයෝජනය කළයුතු වීම. | එක් එක් ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල වැඩිවීම නිසා සියළුම ව්‍යාපෘති සීමිත මිල ගණන් හා විවෘත මිල ගණන් යටතේ ප්‍රසම්පාදන පටිපාටියට අනුව සිදු කිරීමට සිදුවීම නිසා විශාල කාලයක් ගතවීම සහ අග්‍රාමාත්‍ය ලේකම්ගේ 2018 නොවැම්බර් 08 දිනැති ලිපියක් මගින් සංවර්ධන වැඩසටහන් සඳහා කලින් අනුමත |

| | | | |
|---|---|---|---|
| | 2019 වර්ෂයට අවිච්ඡේද කර තිබුණි. | | කරන ලද වැඩසටහන් සඳහා වුවද මුදල් ප්‍රතිපාදන ලබාදීම නැවැත්විය. |

**3.3 ප්‍රසම්පාදනයන්**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | --------------------- |
| (අ) | 2018 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් නිල නිවස අළුත්වැඩියාව සඳහා රු.8,539,007 ක් වැය කර තිබුණි. එහි මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.9,655,676 ක් වී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8(ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණය වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනයට පසුව දින 28 ක් දක්වා වලංගු වියයුතු වුවත් අදියර I හා II සඳහා වන කාර්යසාධන සුරක්ෂණය එලෙස ලබාදී නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ඉටුකළ වැඩ ස්වභාවය අනුව හා ප්‍රතිපාදන ලබාගන්නා වැය විෂයයන් අනුව වෙන වෙනම ප්‍රසම්පාදනයන් සිදුකළ අතර කාර්යසාධන සුරක්ෂණය නිවැරදි කිරීමට දිස්ත්‍රික් ඉංජිනේරුවරයාට උපදෙස් ලබාදෙමි. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා මාතර, කඹුරුපිටිය, මුලටියන, පස්ගොඩ, වැලිගම, දික්වැල්ල, කිරින්ද පුහුල්වැල්ල සහ තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් මගින් 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.1 ප්‍රකාරව සකස්කර කාලීනව සමාලෝචනය කර නොතිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 විසින්ම මාර්ගෝපදේශ 4.2.2 සහ 4.3.3 ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහන සහ කාලරාමුව පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම කාලීනව සමාලෝචනය කළයුතු අතර ප්‍රසම්පාදන කාලසටහන සහ කාලරාමුව පිළියෙල කළ යුතුවීම. | වර්ෂය තුළ ලැබෙන සීමිත ප්‍රතිපාදනවලින් ඒ ඒ අවස්ථාවන්හිදී පැනනඟින ප්‍රමුඛ කාර්යයන් වෙනුවෙන් අවශ්‍ය මිළදී ගැනීම් කිරීමට සිදුවන බැවින් වර්ෂය ආරම්භයේදී ප්‍රසම්පාදන කාලසටහන හා කාලරාමුව පිළියෙල කිරීම ප්‍රායෝගිකව ගැටළුසහගත වේ. |
| (ඇ) | පස්ගොඩ, වැලිගම, දික්වැල්ල සහ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් මිලදීගෙන තිබූ එකතුව රු.1,226,442 ක් වූ පරිගණක, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.6.1(අ) හා | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ඉදිරියේදී නියමිත පිරිවිතරයන් සකස් කර ඒ අනුව මිලදී ගැනීම් සිදුකිරීමටත් මෙවැනි අඩුපාඩු ඉදිරියේදී ඇති නොවීමට වග බලාගන්නා ලෙසත් උපදෙස් දී ඇත. |

5.6.1(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනතට අනුකූල ඉඩම් නියෝග 175 සහ 179 ප්‍රකාරව රජයේ ඉඩම් හඳුනාගෙන ලේඛනගත කිරීම හෝ සිතියම් හඳුනා ගැනීමක් සහිත දත්ත පද්ධතියක් සකස්කර පවත්වාගත යුතුව තිබුණි. නමුත් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ මාතර හා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල එසේ කටයුතු කර නොතිබුණි. | 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත ප්‍රකාරව රජයේ ඉඩම් නිශ්චිතව හඳුනාගෙන ලේඛනගත කිරීමට කටයුතු කළයුතු වීම. | පිළිතුරු සඳහා කාලය ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරියේදී පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. |
| (ආ) | ඉඩම් නියෝග අංක 180 යටතේ ග්‍රාම නිලධාරීන් වෙත පැවරෙන වගකීම් ඉටුකිරීමෙහිලා රජයේ ඉඩම් නිශ්චිතව හඳුනා ගැනීමට අදාළ දත්ත පද්ධතියක් පවත්වා නොතිබුණි. මේ නිසා අනවසර අල්ලා ගැනීම් හා ගොඩකිරීම් සම්බන්ධව වාර්තා කිරීම ආදී කාර්යයන් මන්දගාමීව ඉටු කර තිබුණි. | ඉඩම් නියෝග අනුව කටයුතු කළ යුතු වීම. | පිළිතුරු සඳහා කාලය ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරියේදී පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. |
| (ඇ) | මාතර හා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා සකසන ලද වාර්තාවල හඳුනාගත් රජයේ ඉඩම් ලෙස නම්කර තිබුණු ප්‍රමාණයෙන් එකතුව අක්කර 38 ක් පමණ වූ ඉඩම් 13 ක් සම්බන්ධයෙන් පසු විපරම් සිදුකර ඉඩම් සංරක්ෂණය, ආරක්ෂණ කටයුතු සඳහා සහ ඵලදායීව යෙදවීමට පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඇතැම් ඉඩම් අනවසර ලෙස පරිහරණයන්ට ලක්වී තිබුණි. | හඳුනාගත් රජයේ ඉඩම් සම්බන්ධයෙන් පසු විපරම් කර සංරක්ෂණය හා ආරක්ෂණය සිදුවන පරිදි කටයුතු කළයුතු වීම. | පිළිතුරු සඳහා කාලය ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරියේදී පිළිතුරු ලබාදෙමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රජයේ ඉඩම් දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීමේදී, අවස්ථා 10 කට අදාළව 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉඩම් පරිහරණයන් සිදුකිරීම් ආරම්භ කර තිබුණද, ඉඩම් සම්බන්ධයෙන් දීර්ඝකාලීන බදුකර සැකසීම් 2018 සැප්තැම්බර් 30 දින වනවිටත් නිමකර නොතිබුණි. මේ නිසා එම ඉඩම්වලින් රජයට උපයාගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි. | දීර්ඝකාලීන බදුකර සැකසීමේ කාර්යය නිසි අධීක්ෂණයකින් කාලීනව ඉටු කිරීම තුළින් ඉඩම්වලින් රජයට උපයාගත හැකි ආදායම් ලබා ගැනීමට කටයුතු කළයුතු විම. | පිළිතුරු සඳහා කාලය ප්‍රමාණවත් නොවන බැවින් ඉදිරියේදී පිළිතුරු ලබාදෙමි. |
| (ඉ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක බල ප්‍රදේශවල පිහිටි පාසල් 06 ක්, ඉඩම්, ක්‍රීඩාංගන හා වෙනත් ගොඩනැගිලි පවරා ගැනීම රජයේ ඉඩම් ආඥා පනතේ නියෝග 200, 201 හා 224 ට අනුකූල නොවන පරිදි සිදුකර තිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරා ඇති රජයේ ඉඩම් විධිමත්ව පවරා ගත යුතුවීම. | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිළිතුරු සඳහා කාලය ප්‍රමාණවත් නොවන අතර අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙහි ගම් සිතියම් හා ඉඩම් ලේඛන පරීක්ෂා කර බලා ඉදිරියේදී කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් ලබාදී ඇත. |
| (ඊ) | තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ඉඩම් රජයට අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් වූ තෙළඹුගහහේන, බුලේඋඩුකරහේන, පුංචිකන්දහේන සහ තැන්නහේන ඒකාබද්ධ ඉඩම ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.5184 ක් වී තිබුණි. එම ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 2011 ජූලි 29 දිනැති අත්පත් කර ගැනීමේ පනතේ 2 වගන්තිය යටතේ දැන්වීම් නිකුත් කර 38(අ) අතුරු විධානය යටතේ 2012 මැයි 25 දින ගැසට් පත්‍රයේ නිවේදනයක් නිකුත් කර තිබුණි. 2018 පෙබරවාරි 07 දින වන විටත් මෙම ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | ඉඩම් සම්බන්ධ කාර්යයන් සිදුකිරීමේදී කාලීනව පසු විපරම් සිදුකර කඩිනම් ක්‍රියා මාර්ග ගත යුතුවීම. | අත්පත් කර ගැනීමට යෝජිත ඉඩමට මූලික සැලැස්ම හා කට්ටි විස්තර ලබා ගැනීම සඳහා 2019 ජනවාරි 24 දින මැනුම් ඉල්ලීමක් මැනුම් අධිකාරි වෙත යොමුකර ඇත. |

| | | | |
|---|---|---|---|
| (උ) | මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජයේ ඉඩමක් ලබා ගැනීමට සුදුසු තැනැත්තන් ලියාපදිංචි කිරීමේ කටයුතු 2011, 2013 හා 2017 වර්ෂවල සිදුකර තිබුණි. ඒ අනුව සකසන ලද ලියාපදිංචි කිරීමේ ලේඛනය පරීක්ෂාවේදී 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 1.3.3 හා 1.3.4 ඡේද ප්‍රකාර සිදු කළයුතු ලියාපදිංචි කිරීමේ ලේඛනයේ පිටපත් පළාත් ඉඩම් කොමසාරිස්ට හා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යවා නොතිබුණි. එහෙත් 2018 සැප්තැම්බර් 30 දින වන විට 2014 සහ 2016 වර්ෂවල බලපත්‍ර නිකුත්කර තිබුණු පුද්ගලයින්ගේ නම්, ලියාපදිංචි කිරීමේ ලේඛනයෙන් ඉවත් කර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කළයුතු වීම. | පිළිතුර ඉදිරියේදී ලබාදීමට කටයුතු කරමි. |
| (ඌ) | මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2011, 2013 හා 2017 යන වර්ෂවල පදිංචිය සඳහා ඉඩම් කොටසක් නොමැති පුද්ගලයින් ලියාපදිංචි කිරීම සිදුකර 2018 සැප්තැම්බර් 30 දින වනවිටත් වර්ෂ ගණනාවක් ඉක්මවී තිබුණද, නව ඉඩම් කොටස් බෙදාදීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. 2018 වර්ෂයේ නොමිලේ බලපත්‍ර 132 ක් නිකුත් කිරීමට ඉලක්ක කර තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉලක්කයන් ලඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු කළයුතු විය. | පිළිතුර ඉදිරියේදී ලබාදීමට කටයුතු කරමි. |
| (එ) | මාතර දිස්ත්‍රික්කයේ වැලිගම, අකුරැස්ස, මාතර, මුලටියන හා කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ වසා දැමූ පාසල් 10 ක් ද මාතර, මුලටියන, මාලිම්බඩ හා අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ භාවිතා නොකරන ලද කාර්යාල හා නිළ නිවාස 06 ක් ද වැලිපිටිය, වැලිගම, කිරින්ද පුහුල්වැල්ල හා මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ | ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ වන රජයේ ඉඩම් ගොඩනැගිලි හඳුනාගෙන ඒ සම්බන්ධව කාලීනව කටයුතු කර අදාළ වත්කම් ඵලදායී ලෙස යොදවා ගත යුතු වීම. | තොරතුරු ලබාදෙන ලෙස ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් අංශය වෙත ද, ගොඩනැගිලි සම්බන්ධයෙන් පරිපාලන නිලධාරි වෙත ද උපදෙස් ලබාදී ඇත. |

පේෂකර්මාන්ත අක්‍රියවීම හේතුවෙන් එහි පැවති ගොඩනැගිලි 05 ක් ද වැලිගම, වැලිපිටිය, මාතර හා කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ඉදිවෙමින් පැවති ප්‍රජාශාලා 13 ක් ද, වැලිපිටිය හා මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පැවති එකතුව අක්කර 05 ක් වූ ඉඩම් 02 ක් ද, මුලටියන, මාතර හා පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පිළිවෙලින් බහුකාර්ය ගොඩනැගිල්ලක්, සතිපොළ 02 ක්, මාතෘ සායනයක් ද, මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පැවති "ළඟම පාසල හොඳම පාසල" යටතේ ඉදිකිරීම් ව්‍යාපෘති 02 ක් ද 2018 දෙසැම්බර් 31 දින වනවිට භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

## 3.5 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2005 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක වාහන අනතුරු 19 කට අදාළ එකතුව රු.2,323,132 ක අලාභ හානි සිදුවී තිබුණි. එම අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාළ පාර්ශවයන්ගෙන් අලාභ හානි අයකර ගැනීමට හෝ කපා හැරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතු වීම. | අක්‍රිය ගොනු සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර එහි උපදෙස් අනුව පොතෙන් කපාහැරීමට හෝ අයකර ගැනීමට ක්‍රියා කරන අතර ප්‍රාරම්භක පරීක්ෂණ සිදුකර ඇති වාහන සම්බන්ධයෙන් අවශ්‍ය වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු සිදුකරන බවත් දන්වා සිටිමි. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු කැබ්රථයක් 2018 ජනවාරි 01 දින අනතුරට පත්ව රු.817,250 ක අලාභයක් තක්සේරු කර තිබුණි. මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අවසන් වාර්තාව සකස් කිරීම සඳහා | මුදල් රෙගුලාසි 103,104 හා 109 ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | කඩිනමින් පරීක්ෂණ මණ්ඩලයක් පත්කිරීමට කටයුතු කරන අතර ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සිදුකළ පරීක්ෂණයේ |

| | | | |
|---|---|---|---|
| | 2018 දෙසැම්බර් 31 දින වනවිටත් පරීක්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබුණි. එම රියදුරුගේ වැඩ තහනම් කර තිබුණද 2019 මාර්තු 11 දින වනවිටත් වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එම අලාභයෙන් රක්ෂණ ආයතනයෙන් රු.530,925 ක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබුණි. කාර්යාල පරිශ්‍රයේ තිබුණු මෝටර් රථයට සිදුවූ රු.29,509 ක හානිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2018 අප්‍රේල් 26 දින ගෙවා තිබුණි. එම අනතුර සිදුකළ රථය සඳහා වන රක්ෂණයෙන් එම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. අදාළ අනතුරින් කැබ් රථ දෙකට සහ දුරකථන කනු සඳහා සිදුවූ මුළු අලාභය රු.882,394 ක් වූ අතර අනතුර සිදුවී වර්ෂයකට වැඩි කාලයක් ගතවී තිබුණද, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා සිදුවූ පාඩු පොත්වලින් කපාහැරීමට/අයකර ගැනීමට හා ඊට අදාළ වගකිවයුතු පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද කර තිබුණි. | | විමර්ශන වාර්තාව ලැබෙන තෙක් ඉදිරි කටයුතු කිරීමට නොහැකිවී ඇති බව දන්වමි. අළුත්වැඩියාව සඳහා රු.530,925 ක් පමණක් වැයකර ඇති බැවින් එම ප්‍රමාණය රක්ෂණයෙන් ප්‍රතිපූර්ණය කරගන්නා ලදි. එසේම අවශ්‍ය වාර්තා කඩිනමින් ලබාගෙන ගොනුවේ ඉදිරි කටයුතු කඩිනමින් කරමි. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක සිදුවී තිබූ එකතුව රු.1,945,185 ක් වූ වාහන අනතුරු 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අනතුර සිදුවී මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කළයුතු පූර්ණ වාර්තා සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් සිදු නොවීමට සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත උපදෙස් ලබා දෙමි. |
| (ඈ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාළ එකතුව රු.204,043 ක් වූ වාහන අනතුරු සම්බන්ධ ලිපිගොනු 05 ක් 2018 දෙසැම්බර් 31 දින වනවිටත් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිව අක්‍රීයව පැවතුණි. | අක්‍රිය ගොනු සම්බන්ධව කඩිනමින් ක්‍රියා මාර්ග ගත යුතුවීම. | ඉදිරියේදී අවශ්‍ය වාර්තා ලබාගෙන කඩිනමින් කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2017 වර්ෂයේදී ඇතිවූ හදිසි ගංවතුර හේතුවෙන් කාර්යාල 05 ක එකතුව රු.3,251,250 ක් වූ හානි සම්බන්ධව මුදල් රෙගුලාසි 104 හා 109 ප්‍රකාර කටයුතු කර එම අලාභහානි පොත්වලින් කපා හැරීමට 2019 මැයි 31 දින වනවිටත් අපොහොසත් වී තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | රු.250,000 ඉක්මවන හානි සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ රාජකාරි වැඩ පහසුවන සේ අදාළ වාර්තා සකස් කර ඉදිරිපත් කර ඇත. මුදල් රෙගුලාසි 104 අනුව අවසන් පරීක්ෂණ මණ්ඩලයක් පත්කළ යුතු නිලධාරීන් සම්බන්ධව නිර්දේශයන් ද ලබාදී ඇත. |
| (ඊ) | 2018 දෙසැම්බර් 31 දිනට වාහන අනතුරු හැර එකතුව රු.15,840,000 ක් වූ පාඩු හා හානි වර්ෂ 06 ක සිට වර්ෂ 34 ක් දක්වා කාලයක සිට ඉදිරියට ගෙනෙමින් පැවති අතර ඒ තුළ 2004 දෙසැම්බර් 26 දින ඇතිවූ සුනාමි ව්‍යසනයෙන් සිදුවූ එකතුව රු.14,965,038 ක් වූ හානි ද ඇතුළත් වී තිබුණි. නමුත් මෙම පාඩු හා හානි කපා හැරීමට හෝ අයකර ගැනීමට 2019 මාර්තු 11 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | පාඩු හා හානි සම්බන්ධව කඩිනමින් ක්‍රියා මාර්ග ගත යුතුය. | ඉදිරියේදී කඩිනමින් වාර්තා ලබාගෙන ලිපිගොනු කටයුතු අවසන් කරමි. |

**3.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 25 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 02 කට 2019 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළව ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.1,155,811,607 ක් විය. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සියළු විගණන විමසුම් සම්බන්ධයෙන් නිරීක්ෂණ කැඳවා ඇති අතර ඉදිරියේදී කඩිනමින් පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව 2030 වර්ෂය වන විට ළගා කර ගත යුතු අරමුණු හා ඉලක්ක සම්බන්ධයෙන් 2018 වර්ෂයේදී අවධානය යොමුකර නොතිබුණු අතර තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට 2019 මැයි 08 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂය සහ ඉදිරියේදී සෑම වර්ෂයක් සඳහාම වන තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නැත. |

**5. යහපාලනය**

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වෙබ් අඩවියක් නිර්මාණය කර ඒ තුළින් අවශ්‍ය දැනුවත් කිරීම් හා මහජනයාගේ පැමිණිලි ලබාගැනීමේ ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි. | වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට කටයුතු කළ යුතු වීම. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල ආවරණය වන ආකාරයට සකස් කරන ලද ආකෘතියකට අනුව 2018 වර්ෂයේ සිට මෙම කාර්යාල වෙනුවෙන් වෙබ් අඩවිය යාවත්කාලීන කර ඇත. එම වෙබ් අඩවිය තුළ විද්‍යුත් තැපැල මගින් මහජනතාවට පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකියාව ඇත. |
| (ආ) | මහජනයා විසින් ඉදිරිපත් කරනලද පැමිණිලි සම්බන්ධයෙන් මහජන පැමිණිලි ලේඛනයක් පවත්වා නොතිබුණි. | මහජන පැමිණිලි ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | මහජනතාවගෙන් වෙබ් අඩවිය හරහා පැමිණිලි හෝ පණිවිඩ ලැබෙන ප්‍රවණතාවයක් නැත. එබැවින් ඒ සඳහා පැමිණිලි ලේඛනයක් පවත්වාගෙන ගොස් නැත. ඉදිරියේදී අවශ්‍යතාවය අනුව පැමිණිලි ලේඛනයක් පවත්වාගෙන යාමට උපදෙස් දෙමි. |